රටේ අනාගතය භාරගැනීමට සිටින මෙවැනි ළමුන් ආරක්ෂා කිරීමට රාජ්‍ය විසින් ජාත්‍යන්තර ප්‍රඥප්තීන් සම්මුතීන් සහ ප්‍රමිතීන් පිළිගෙන ඇති අතර එම ප්‍රමිතීන් සහ න්‍යායන් තුළින් දේශීය සන්දර්භයට අනුකූලව අණ පනත් සහ ක්‍රියාකාරී ආයතනයන් පිහිටුවා ඇත්තේය. නමුත් ප්‍රතිඵලය පිළිබඳ සලකා බැලීමේ දී මෙවැනි නීති රීතීන් සහ ආයතන මගින් සිදු කරනු ලබන සේවය ළමයාගේ උපරිම යහපත සඳහා වන්නා වූ දායකත්වය අවම වී ගොස් ඇත්තේය. ඒ අනුව ළමයාගේ අනාගතය නිර්මාණය කිරීමේ දී ළමයාගේ උපරිම යහපත උදෙසා ක්‍රියා කිරීමේ බරපතල අවශ්‍යතාවයක් ඉස්මතුවී ඇත්තේ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය බිඳවැටීම, නීතිමය දැනුම යාවත්කාලීන නොවීම, විශේෂ පුහුණු නොමැති වීම, ශල්‍යපැතිගිය ආකල්පමය තත්වයන්හි එල්බ සිටීම සහ අවශ්‍ය පරිදි රාජකාරිය ඉටු නොකිරීම වගවීමක් ඇති නොවන පරිදි කටයුතු කිරීම යන කරුණු නිසාවෙනි.

මෙවන් තත්වයක් තුළ ළමුන් පිළිබඳ කටයුතු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශයක දැඩි අවශ්‍යතාවය මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදුකළ අධ්‍යයනයේ දී වඩාත් ගම්‍ය විය. ඒ අනුව පහතින් සවිස්තරව පෙන්වා දී ඇති පරිදි මානව හිමිකම් කොමිෂන් සභාවේ කර්තව්‍ය, ළමයින් සම්බන්ධ ජාත්‍යන්තර, දේශීය නීති හා රාජ්‍ය ආයතනයන් පිළිබඳව මනා අවබෝධයකින් යුතුව රාජකාරී කටයුතු සිදුකිරීමට පසුබිමක් සකස් කිරීමය.

මෙම මාර්ගෝපදේශය ළමුන් සහ යෞවනයන්ගේ ජීවිත වඩාත යහපත් කිරීමේ අරමුණු පෙරදැරිව පොදු එකඟතාවයන් මත සැකසුණු මුද්‍රිත ලේඛණයක් පමණක් නොවිය යුතු අතර මනුෂ්‍යත්වයේ අනාගතය ළමුන් මත රඳා පවතින බැවින් අර්ථාන්විත ජීවිතයකට හිමිකාරත්වය ලබාදීමට සියළු රාජ්‍ය නිලධාරීන්ගේ උනන්දුව හා ක්‍රියාකාරීත්වය මත සිදු කළ යුත්තකි.

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 1996 අංක 21 දරන පනත මගින් පිහිටුවන ලද ස්වාධීන කොමිෂන් සභාවකි. මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම, සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම, නිර්දේශ ඉදිරිපත් කිරීම, රැඳවියන් රඳවා තබන ස්ථාන පිළිබඳ අධීක්ෂණය කිරීම, මානව හිමිකම් පිළිබඳ ප්‍රවර්ධන කටයුතු පර්යේෂණ පැවැත්වීම සහ රජය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම මානව හිමිකම් කොමිෂන් සභාවේ මූලික කර්තව්‍යයන් අතර ප්‍රධාන වශයෙන් කැපී පෙනේ.

මීට අමතරව 10 (ඉ) වගන්තිය ප්‍රකාරව මානව හිමිකම් ක්ෂේත්‍රයේදී ගිවිසුම් වලට සහ වෙනත් ජාත්‍යන්තර සාධන පත්‍ර වලට දායකවීමේ හා එකඟවීමේ අවශ්‍යතාවය පිළිබඳව රාජ්‍යයට නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ද ප්‍රමුඛ වේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 11 (ඇ) වගන්තිය ප්‍රකාරව අධිකරණ ආඥාවක මගින් හෝ අණපනකාරයකින් හෝ රඳවා සිටින තැනැත්තන්ගේ සුභ සිද්ධිය, ඔවුන් රඳවා සිටින ස්ථාන නිරතුරුව පරීක්ෂා කිරීමෙන් සුපරීක්ෂණය කිරීම සහ ඔවුන් රඳවා ගෙන සිටීමේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ ප්‍රමුඛ කාර්යයක් වේ.

කොමිෂන් සභා පනතේ 10 (ඇ) සහ (11) (ඌ) වගන්ති ප්‍රකාරව වගන්තිය මූලික අයිතිවාසිකම් වැඩිදියුණු කිරීමේ ප්‍රවර්ධනය කිරීමේ, ආරක්ෂා කිරීමේ නීතිමය සහ පරිපාලනමය විධාන හා කාර්ය පටිපාටිය සකස් කිරීමෙහිලා ආණ්ඩුවට උපදෙස් දීම සහ සහායවීම යන කර්තව්‍ය පෙරදැරි කර ගනිමින් 11 (ඌ) වගන්ති ප්‍රකාරව කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍යවන්නා වූ හෝ හිතකර වන්නාවූ වෙනත් සියළු දේ කිරීම යන බලතල ප්‍රකාරව ළමයින් පිළිබඳව කටයුතු කරන රාජ්‍ය නිළධාරීන් පිළිපැදිය යුතු මාර්ගෝපදේශ සකස්කිරීමේ වගකීම කොමිෂන් සභාව ඉටුකරන ලදී. මෙය, ළමයාගේ උපරිම යහපත, සහ සුභ පැවැත්ම උදෙසා කටයුතු කිරීමට රාජ්‍ය නිළධාරීන්ට මහඟු උපකාරයක් වනු නොඅනුමානය.

# ළමයින් සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රමිතීන්

ළමා අයිතිවාසිකම් සම්බන්ධ මූලික අවධානය ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ රීතීන් මගින් ව්‍යාප්ත කර ඇත. එමගින් රාජ්‍යය සහ සමාජය ළමයාගේ යහපත සඳහා ගතයුතු පියවර පිළිබඳ අවධාරණය කරනු ලැබේ. තවදුරටත් එමගින් ළමා හිමිකම් සුරක්ෂිත කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් ඔස්සේ මුළු ලොවටම මගපෙන්වීමක් ලබා දෙයි. එතුළින් ළමා හිමිකම් සුරක්ෂිත කිරීමට රාජ්‍යයක් යුතු බැඳීම, ගරු කිරීම සහ ආරක්ෂා කිරීමේ වටිනාකම පිළිබඳව රාජ්‍යයන් වෙත එත්තු ගැන්වීමක් ද සිදුකරයි.

| ප්‍රඥප්ති/සම්මුති | අදාළ කරුණු |
|---|---|
| මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය | • සෑම පුද්ගලයකුටම ජීවත්වීමටත්, නිදහස්ව සිටීමටත්, පෞද්ගලික ආරක්ෂාවටත් හිමිකම ඇත්තේය.<br>• පවුල සමාජයේ මූලික ඒකකය වේ. එයට සමාජයේ සහ රාජ්‍යයේ රැකවරණය ලැබිය යුතුය.<br>• ළදරුභාවය විශේෂ උපකාර හා ආරක්ෂාව උරුම කරගන්නේය. විවාහක, අවිවාහක මවුවරුන්ගෙන් ලැබෙන සියළුම දරුවෝ සමාන ආරක්ෂාවට අයිතිය ඇත්තේය. |
| ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය | • පවුල සමාජයේ මූලික ඒකකය වේ.<br>• ළමයින් සහ තරුණයන් වෙනුවෙන් විශේෂ ආරක්ෂාව ලබාදිය යුතුය.<br>• දරුවන්ගේ සදාචාරය සෞඛ්‍යයට හානිකර හෝ ජීවිතයට අනතුරු දායක හෝ සාමාන්‍ය වර්ධනයට බාධාකාරී වන්නාවූ රැකියාවල යෙදීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.<br>• ළමයින් හා තරුණයින් ආර්ථික වශයෙන් හා සමාජීය වශයෙන් ආරක්ෂා කර ගත යුතුය.<br>• සෑම ළමයකුටම අධ්‍යාපනයට ඇති අයිතිවාසිකම් පිළිගනිති. |
| සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය | • පුද්ගල නිදහසට සහ සුරක්ෂිතභාවයට අයිතිවාසිකම් ඇත්තේය.<br>• නිදහස අහිමි කරනු ලැබූ සියළුම තැනැත්තන්ට මනුෂ්‍ය දයාවෙන් සහ මිනිසාට ස්වභාවයෙන් හිමි අභිමානය පිළිබඳව ගෞරවයෙන් සැලකිය යුතුය.<br>• චූදිත බාලකයන් වැඩිහිටියන්ගෙන් වෙන්කර තැබිය යුතු අතර ඔවුන්ගේ වයස හා නීතිමය තත්ත්වයන්ට අවශ්‍ය පරිදි සැලකිල්ලක් දැක්වීම හා ඉක්මනින් විනිශ්චයට භාජනය කළ යුතුය.<br>• බාලවයස්කරුවන් සම්බන්ධයෙන් නඩු පවරන විට ඔවුන්ගේ වයස සහ පුනරුත්ථාපනය කිරීමේ යෝග්‍යතාවය අනුව විය.<br>• පවුල සමාජය මූලික ඒකකය වේ.<br>• කිසිදු වෙනස්කමකට ලක් නොවී ඔහු පවුලෙන්, සමාජයෙන්, රාජ්‍යයෙන් බාල වයස් කරුවෙකු වශයෙන් ලැබිය යුතු අයිතීන් හිමිවිය යුතුය.<br>• ජාතිකත්වයට සහ නමක් ලැබීමට හිමිකමක් ඇත. |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තිය | • සියළු රාජ්‍යයන් ළමා අයිතීන් වලට ගරු කිරීමට සහ අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට පියවර ගත යුතුයි.<br>• සියළුම තැනැත්තන්ගේ මූලික අරමුණ විය යුත්තේ ළමයාගේ උපරිම යහපත සංකල්පය මත පිහිටා කටයුතු කිරීමයි.<br>• ළමයින්ගේ භාරය සහ රැකවරණය උදෙසා වගකිව යුතු වන ආයතන එහි සේවාවන් පහසුකම්, ආරක්ෂාව, සෞඛ්‍ය සහ කාර්ය මණ්ඩලයේ යෝග්‍යතාවය බලධාරීන් විසින් පිහිටුවන ලද ප්‍රමිතීන්ට අනුව සිදුවන බවට රාජ්‍ය විසින් වගබලාගත යුතුය.<br>• නිදහස් සමාජයක වගකීම් සහිත ජීවිතයක් සඳහා ළමයා සූදානම් කළ යුතුය.<br>• ළමයා සහ ඔහුගේ හිමිකම් සම්බන්ධ සෑම අංශයක් පිළිබඳවම අවධානය යොමු කර ඇත. |
| ළමයින් අලෙවි කිරීම, ගණිකා වෘත්තියේ යෙදවීම සහ අසභ්‍ය ප්‍රකාශන අරමුණු කර ළමා අයිතිවාසිකම් පිළිබඳව අන්තර්ජාතික සම්මුතියට සිදුකල වෛකල්පිත ගිවිසුම | • ළමයින් අලෙවි කිරීම, ගණිකා වෘත්තියේ යෙදවීම සහ ළමයින් අසභ්‍ය ප්‍රකාශන සඳහා යොදාගැනීම තහනම් කිරීම පිළිබඳ කරුණු එකතු කර ඇත. |
| ළමයින් යුධ කටයුතු සඳහා යොදාගැනීම පිළිබඳව අරමුණු කර ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට එකතු කල වෛකල්පිත ගිවිසුම | • ළමයින් යුධ කටයුතු වලට යොදා ගැනීම පිළිබඳ සහ එම තත්වය වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග මෙහි දක්වා ඇත. |

| ප්‍රඥප්ති/සම්මුති | අදාළ කරුණු |
| --- | --- |
| අන්තර්ජාතික කම්කරු සංවිධානය (1973) අවම වයස් පිළිබඳ ප්‍රඥප්තිය | • ළමයින් යුධ කටයුතු වලට යොදා ගැනීම පිළිබඳ සහ එම තත්වය වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග |
| අන්තර්ජාතික කම්කරු සංවිධානය (1999) ළමා ශ්‍රමය අයහපත් ආකාරයෙන් යොදා ගැනීම සම්බන්ධ ප්‍රඥප්තිය | • රැකියාවක හෝ වෘත්තියක යෙදීම සඳහා අවශ්‍ය වන අවම වයස පිළිබඳව සහ ළමයින් හඳුන්වාදී ඇත. |
| නිදහස සීමාකළාවූ යෞවනයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් වූ එක්සත් ජාතීන්ගේ රීතීන් / ප්‍රමිතීන් | • නිදහස සීමා කළාවූ යෞවනයාගේ ආරක්ෂාව සම්බන්ධයෙන් රාජ්‍ය මැදිහත්වීම සිදුවිය යුතු ආකාරය ගැන දක්වා ඇත. |
| බාලක යුක්ති සම්බන්ධ පරිපාලන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පවත්වාගත යුතු එක්සත් ජාතීන්ගේ අවම ප්‍රමිතීන් (බීජිං ප්‍රමිතීන්) | • බාලකයින් රඳවා තබන ස්ථානයන පරිපාලනය ක්‍රියාත්මක විය යුතු ආකාරය පිළිබඳ මග පෙන්වීම |
| ළමා අපරාධමය කරුණු පිළිබඳ යුක්තිය පසිඳලීමේදී ක්‍රියාත්මක කළ යුතු මාර්ගෝපදේශය | • ළමා අපරාධමය කරුණු සම්බන්ධයෙන් යුක්තිය පසිඳලන අවස්ථාවේදී ක්‍රියාත්මක විම සම්බන්ධයෙන් මගපෙන්වීම. |
| යෞවනයින් අපරාධමය හැසිරීම් රටාවලින් වළක්වා ගැනීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශය (රියාද් මාර්ගෝපදේශය) | • අපරාධමය හැසිරීම් රටාවලට ළමයින් යොමුවීම වළක්වා ගැනීම සඳහා ක්‍රියාත්මක විය යුතු ප්‍රාකාරය පිළිබඳ මගපෙන්වීම. |
| කාන්තාවන් සහ ළමයින් ගණිකා වෘත්තිය, කුට්ටනය කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිවීම සම්බන්ධයෙන් වූ සාර්ක් ප්‍රඥප්තිය | • සාර්ක් කලාපීය රටවල්වල කාන්තාවන් සහ ළමයින් ගණිකා වෘත්තිය, කුට්ටනය කිරීම වැළැක්වීමට එරෙහි කටයුතු කිරීම. |

# ළමයින් සම්බන්ධ දේශීය නීති

දේශීය නීතිය තුළින් රාජ්‍ය ප්‍රතිපත්තීන් අළලා ළමයා සම්බන්ධයෙන් නීති රීති සම්පාදනය කරයි. තවද එවැනි නීති තත්වයන් වර්ධනය කර ගැනීමට හා රට තුළ යහ පාලනයක් ඇති කිරීමට ජාත්‍යන්තර සංධානයන් විසින් එළඹුණු එකඟතාවයන්, නිර්දේශයන් ද ඇතුළත් කර ගනිමින් වැඩිදුරටත් දේශීය නීතිය ප්‍රවර්ධනය කොට ඇත. එතුළින් රාජ්‍ය නිළධාරීන් වෙත තම කටයුතු පවත්වා ගෙන යාමට බලතල ලබා දී ඇති අතර පවතින දේශීය ළමා නීතීන් උපයෝගී කර ගනිමින් ළමයාගේ උපරිම යහපත යන සංකල්පය මත පිහිටා කටයුතු කිරීමට හැකියාව ඇත.

| ව්‍යවස්ථා/පනත් | විෂයගත කරුණු |
|---|---|
| 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | • ළමයින්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග සහ සමානාත්මතාවය යන මූලධර්මය<br>• ළමයින් සහ යෞවනයින්ගේ කායික සහ මානසික විෂයෙහි සදාචාරාත්මක විෂයෙන් ආගමික විෂයෙන් සහ සාමාජීය විෂයෙහි පූර්ණ වර්ධනයක් ඇති කිරීමට රජය වග-බලාගත යුතු බව |
| 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (අයි.සී.සී.පී.ආර්) පනත | • උපත ලියාපදිංචි කිරීමට සහ නමක් ලැබීමට, ජාතිකත්වය ලබාගැනීමට, හිංසා කරනු ලැබීමෙන්, නොසලකා හරිනු ලැබීමෙන්, අපයෝජනය කරනු ලැබීමෙන් හෝ අවමන් කරනු ලැබීමෙන් වැළකී සිටීමට ඇති අයිතිය<br>• ළමයාට අසාධාරණයක් වන අවස්ථාවල නීති ආධාර ලබාගැනීමට පවතින අයිතිය<br>• සාමර හෝ ආයතනයක් ළමයින්ට අදාළව කටයුතු කිරීමේ දී ළමයාගේ උපරිම යහපත යන මූලධර්මය මත කටයුතු කළ යුතු බව |
| 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත | • පරිගණක සේවා සපයන පුද්ගලයින් ළමා අපයෝජන වැළැක්වීම සම්බන්ධයෙන් පවතින වගකීම ළමයින් අපහරණ සහ පැහැරගෙන යාම සඳහා නීතිය ප්‍රතියෝජනය කිරීම |
| 2005 අංක 30 දරන වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීමේ පනත | • ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම |
| 2005 අංක 16 දරන සුනාමි (විශේෂ විධිවිධාන) පනත | • සුනාමියෙන් අනාථ වූ දරුවන්ගේ භාරකාරත්වය, සුභසාධන සහ කුලවැද්දීම පිළිබඳව |
| 2005 අංක 34 දරන ගෘහස්ථ හිංසනය වැළැක්වීමේ පනත | • ගෘහස්ථ තුළ සිදුවන හිංසනයන් වැළැක්වීම සහ ළමුන්ගේ ආරක්ෂාව රැකවරණය වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග |
| 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරී පනත | • සියළු ආකාරයේ ළමා අපයෝජනයන් වැළැක්වීම සහ ඊට විරුද්ධව ක්‍රියා කිරීම<br>• අපයෝජනයට ලක්වූ යම් දරුවෙකුගේ ආරක්ෂාව සහ ප්‍රතිකාර කිරීමට යොමු කිරීම |
| 1939 අංක 48 දරන ළමා හා යෞවන ආඥා පනත හා එහි සංශෝධන | • ළමා මහේස්ත්‍රාත් අධිකරණ පිහිටුවීම<br>• ළමා සහ තරුණ පුද්ගලයන්ගේ භාරය සහ ආරක්ෂාව<br>• ළමා වැරදිකරුවන් පිළිබඳ අධිකරණ කටයුතු කිරීම සහ ඒ සම්බන්ධිත අනෙකුත් කාරණයන් |
| 1927 අංක 4 දරන අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත | • ළමුන් සම්බන්ධව ඔවුන්ගේ යහපැවැත්මට බාධා කරමින් කරනු ලබන අසභ්‍ය ප්‍රකාශන වැළැක්වීම |
| 1944 අංක 42 දරන වරදකරුවන් පරිවාස ගත කිරීම පිළිබඳ ආඥා පනත සහ සංශෝධන | • වරදකරුවන් පරිවාසගත කිරීම<br>• පරිවාසගත කරන්නවුන් අධීක්ෂණය කිරීම සහ පරිවාස සේවාවේ පරිපාලන වගකීම පැවරීම |
| 1939 අංක 28 දරන යෞවන වරදකරුවන් (පුහුණු පාසල්) පිළිබඳ ආඥා පනත හා එහි සංශෝධන | • යෞවන වරදකරුවන් රඳවා තබා ගැනීම<br>• පුහුණු කිරීම හා ඔවුන් පුනරුත්ථාපනය කිරීම |

| ව්‍යවස්ථා/පනත් | විෂයගත කරුණු |
|---|---|
| 1841 අංක 04 දරන පාදඩ (අයාල) ආඥා පනත | • අයාලේ යාම සම්බන්ධ නීති තත්වය |
| 1907 අංක 05 දරන රැඳවුම් නිවාස පනත | • අයාලේ යන්නන් වරදකරු කළ පසු රඳවා තබා ගැනීම සඳහා රැඳවුම් නිවාස පිහිටුවීම |
| 1883 අංක 12 දරන දණ්ඩ නීති සංග්‍රහය<br>•1995 අංක 22 දරණ හා<br>•1998 අංක 29 දරණ (සංශෝධන) | • ළමයින් සම්බන්ධ ලිංගික අපරාධමය අවස්ථා හඳුනවා දීම සහ දඬුවම් වැඩි කිරීම<br>• ශරීර දඬුවම සම්බන්ධ නීති පාදව සංශෝධන |
| 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනත (1995 අංක 20, 1997අංක 19, 1998 අංක 28 දරණ එකී සංශෝධන) | • අපරාධමය වරදක් සිදුකරන ලද පුද්ගලයෙකු සම්බන්ධව අධිකරණ කාර්යපටිපාටිය |
| 1999 අංක 37 දරන නඩත්තු (සංශෝධන) පනත | • කලලුන විවාහ දරු පවුල නඩත්තු කිරීම පිළිබඳ නීති තත්ව |
| 1865 අංක 07 දරන වයෝපූර්ණත්ව ආඥාපනත | • ශ්‍රී ලංකාව තුළ වයස්පූර්ණත්ව වයස් සීමාව අවු: 21 වේ<br>• මෙය 1987 සංශෝධනයෙන අවු: 18 දක්වා අඩු කර ඇත |
| 1951 අංක 17 දරන උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ ආඥාපනත | • දරු උපත් සහ මරණ ලියාපදිංචි කිරීම |
| 1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනත (1995 අංක 18 දරණ හා 1997 අංක 12 දරන සංශෝධනය) | • මුස්ලිම් විවාහ හැර වෙනත් විවාහ ලියාපදිංචි කිරීම තුළින් දරුවන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීම |
| 1952 අංක 44 දරන උඩරට විවාහ දික්කසාද ආඥාපනත (1995 අංක 19 දරන සංශෝධනය) | • උඩරට විවාහයක වලංගු බව, දරුවන් නීත්‍යානුකූල කිරීම, විවාහය සඳහා වයස සම්බන්ධව ඇති අවශ්‍යතාවය, එවන් විවාහ ලියාපදිංචි කිරීම සහ ක්‍රියාපටිපාටිය අඩංගු වේ. |
| 1939 අංක 31 දරන අධ්‍යාපන ආඥාපනත සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසි | • වැඩිමත් අධ්‍යාපනය විධිවිධාන අඩංගු වේ |
| 1979 අංක 38 දරන පනතින් සංශෝධිත කුලවද්දා ගැනීමේ ආඥා පනත (1992 අංක 15 දරන සංශෝධන) | • දරුවන් කුලවද්දා ගැනීම, ස්වභාවික දෙමාපියන් නොවන දරුවන්ගේ ආරක්ෂාව භාරය හෝ පාලනය කරන පුද්ගලයින් ලියාපදිංචි කිරීම |
| 1956 අංක 47 දරන කාන්තාවන්, යොවුනයන් හා ළමයින් සේවයේ යෙදවීමේ පනත සහ ඒ යටතේ පනවා ඇති රෙගුලාසි | • ළමා පිරිස් සේවයේ යෙදවීමේදී බලපාන නීති තත්වයන් |
| 1979 අංක 41 දරන බීමත්කම යටතේ සිදුකරන වැරදි පිළිබඳ ආඥාපනත | • වයස අවුරුදු 12ට අඩු දරුවන් බීමත්කරවීම සහ අවුරුදු 18ට අඩු ළමයින්ට මත් ද්‍රව්‍ය විකිණීම පිළිබඳ වරද සහ දඬුවම් |
| 1941 අංක 22 දරන අනාථ නිවාස ආඥාපනත | • අත්හැර දමන ලද දරුවන් සහ අනාථ දරුවන්ගේ නඩත්තුව<br>• ආරක්ෂාවට සහ නවාතැන් උදෙසා රඳවා තබන ස්ථාන<br>• අනාථ නිවාස පාලනය සහ ලියාපදිංචිය |

# ශ්‍රී ලංකාවේ ළමයින් සම්බන්ධිත ආයතනයන්

**අමාත්‍යාංශය**
ළමයින් සම්බන්ධ ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම

**ජාතික ළමාරක්ෂක අධිකාරිය**
ළමයින් සඳහා ආරක්ෂිත පරිසරයක් නිර්මාණය කිරීම සහ ළමා හිමිකම් භාවිතයන් වැඩිදියුණු කිරීම.
ළමයින් අපයෝජන වලින් සහ සූරාකෑම් වලින් වැළැක්වීම තහවුරු කිරීම

**පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**
ශ්‍රී ලංකාවේ සියළුම ළමයින්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම

අනාථ, අන්තඃ සහ අසරණ ළමුන් සඳහා ආරක්ෂාව ලබාදීම

**ළමා ලේකම් කාර්යාලය**
ළමයින්ගේ පූර්ව ළමාවිය සංවර්ධනය වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ආයතන වලට අවශ්‍ය මගපෙන්වීම, ප්‍රතිපත්ති සම්පාදනය සහ සම්බන්ධීකරණය සිදුකිරීම

## ළමා හිමිකම් සුරක්ෂිත කිරීමේ ආයතනික ව්‍යුහය

**ළමා සංවර්ධන සහ කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය**

**වෘත්තීය පුහුණු සහ කාර්මික අධ්‍යාපන අමාත්‍යාංශය**

**ජාතික ආධුනිකත්ව සහ කාර්මිකයින් පුහුණු කිරීම් අධිකාරිය**
වෘත්තීය පුහුණු පාඨමාලා පැවැත්වීම

**ආරක්ෂක අමාත්‍යාංශය**

**පොලිස් ළමා සහ කාන්තා කාර්යාංශය**
ළමයින් සම්බන්ධ පැමිණිලි විමර්ශනය කිරීම සහ අධිකරණයට සහයෝගය දැක්වීම
ළමා හිමිකම් ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කිරීම

**සෞඛ්‍ය සහ පෝෂණ අමාත්‍යාංශය**
සෞඛ්‍ය පහසුකම් ලබාදීම සහ ප්‍රතිශක්තිකරණ වැඩසටහන් පැවැත්වීම

**ආබාධිත පුද්ගලයින් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලය**
ආබාධිත දරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීම

**අධිකරණ සහ නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය**

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව - තරුණ වරදකරුවන්වූවන්ගේ පුහුණු පාසල**
අධිකරණය මඟින් වරදකරු ලෙස නම් කළ තරුණ වරදකරුවන් පුනරුත්ථාපනය කිරීම

**සමාජ සේවා සහ සමාජ සුභසාධක අමාත්‍යාංශය**

**ජාතික උපදේශ අංශය**
මනෝවිද්‍යාත්මක උපදේශන සේවා සැපයීම

**ළමා මහේස්ත්‍රාත් අධිකරණ**
ළමයින් සම්බන්ධ අධිකරණ කටයුතු මෙහෙයවීම

**කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍යාංශය**

**යෞවන කටයුතු අමාත්‍යාංශය**

**සමාජ සේවා දෙපාර්තමේන්තුව**
වරප්‍රසාද හීන කණ්ඩායම් සහ සමාජමය වශයෙන් කොන්වූ කණ්ඩායම් වලට සහන සහ පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම

**කම්කරු දෙපාර්තමේන්තුව - කාන්තා සහ ළමා අංශය**
ළමයින් සම්බන්ධ පැමිණිලි විභාග කිරීම

ළමයින් සම්බන්ධ දැනුවත් කිරීම්, පුහුණු කිරීම් සහ පර්යේෂණ පැවැත්වීම

**ජාතික තරුණ සේවා සභාව**
ආර්ථික, මානසික, ශාරීරික, දේශපාලන හා සංස්කෘතික වශයෙන් තරුණයින් බලගැන්වීම

**අධ්‍යාපන අමාත්‍යාංශය**
දරුවන්ට ප්‍රාථමික, කනිෂ්ඨ, ද්විතීක අධ්‍යාපනය ගුණාත්මකභාවයකින් ලබාදීම

**පළාත් අමාත්‍යාංශය**

**පළාත්බද පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය**
රජයේ ළමා නිවාස පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම
පළාත තුළ වන ස්වේච්ඡා ළමා නිවාස අධීක්ෂණය කිරීම
දරුවන් කුලවද්දා ගැනීමට අවශ්‍ය පහසුකම් ලබාදීම

**පළාත්බද අධ්‍යාපන අමාත්‍යාංශය**
පළාත් මට්ටමින් දරුවන්ට ප්‍රාථමික, කනිෂ්ඨ, ද්විතීක අධ්‍යාපනය ගුණාත්මකභාවයකින් ලබාදීම

**පළාත්බද සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**
පළාත් මට්ටමින් සෞඛ්‍ය සේවාවන් පවත්වාගෙන යාම

**පළාත්බද සමාජ සේවා දෙපාර්තමේන්තුව**
වරප්‍රසාද හීන සහ විශේෂ අවශ්‍යතා ඇති කණ්ඩායම් වලට අවශ්‍ය සේවා සැපයීම

**පළාත්බද පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය**
පළාත් මට්ටමින් පූර්ව ළමාවිය අධ්‍යාපනයට අවශ්‍ය ක්‍රියාකාරකම් සිදුකිරීම සහ පහසුකම් සැපයීම

## I වන කොටස :

# ළමුන් සම්බන්ධයෙන් රාජ්‍ය නිළධාරීන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ මාර්ගෝපදේශය

ළමයින් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන නිළධාරීන්ටම වෙන්වූ තම සුවිශේෂී රාජකාරි පැවතියද, ළමයා කෙරෙහි මූලික අවධානයෙන් යුක්තව කටයුතු කිරීමේදී සියළු නිළධාරීන් විසින් පොදුවේ අනුගමනය කළ යුතු පොදු මාර්ගෝපදේශය :-

01 සෑම ළමයකුගේම සුභ සාධනය හා උපරිම යහපත යන පොදු මූලධර්මය මත පිහිටා කටයුතු කිරීම කල යුතුය.

02 සාවධානව සහ බුද්ධිමත්ව ළමයාට ඇහුම් කන්දිය යුතුය.

03 ළමයාගේ ප්‍රකාශය මව් බසින් කළ යුතුය. එසේ කළ නොහැකි අවස්ථාවලදී, පරිවර්තන සහය ලබාදීමට හා ලබා ගැනීමට පියවර ගත යුතුය.

04 සංවර්ධනයට, ආරක්ෂාවට සහ සහභාගීත්වයට ඇති අයිතීන් ළමයින්ගේ මූලික අයිතිවාසිකම් සේ සලකා කටයුතු කල යුතුය.

05 විශේෂ අවශ්‍යතා ඇති ළමුන් විෂයගත වන අවස්ථාවලදී ඒ සඳහා යුදුසු විශේෂ ප්‍රතිපාදනයන් අනුගමනය කළ යුතුය.

06 ආයතනගත කිරීම වෙනත් කිසිදු විකල්පයක් නොමැති අවස්ථාවක පමණක් සිදුකළ යුතු අතර එම ආයතනගත කිරීමද, හැකි අවම ප්‍රමාණයෙන්ම සිදුකල යුතුය.

07 ආයතනගත කිරීම හුදෙක්ම පුනරුත්ථාපන/ නිවැරදි කිරීමේ ක්‍රියාවලියක් මිස දඬුවමක කොටසක් ලෙසය නොසැළකිය යුතුය.

08 ළමයින් ආයතනගත කිරීමේදී ඒ සඳහා වෙන් වූ ආයතනයක් පවත්වාගෙන යා යුතුය.

09 ආයතනගත කිරීමේදී වයස, ස්ත්‍රී/ පුරුෂභාවය, ආරක්ෂාව සහ අධ්‍යාපනයට ප්‍රමුඛත්වයක් ලබාදිය යුතු අතරම සමාජීය, වෘත්තිය පුහුණු, වෛද්‍ය, මනෝවිද්‍යාත්මක සහ උපදේශන සේවා සැපයීම ආදී අංශ පිළිබඳවද, සැළකිල්ලක් දැක්විය යුතුය.

10 ළමයින්ට තමා වෙනුවෙන් අවශ්‍ය නීතිඥ සහාය ලබාගැනීම, නොමිළේ නීති ආධාර ලබාගැනීමට අදාළ නිලධාරීන් අවශ්‍ය කටයුතු සම්පාදනය කර දිය යුතුය.

11 දෙමාපියන්ට සහ භාරකරුවන්ට පුනරුත්ථාපන ක්‍රියාවලියට සම්බන්ධවීමට හිමිකමක් ඇත. ආයතනගත කිරීමේ හේතුවට දෙමාපියන් හෝ භාරකරුවන් සම්බන්ධ නම් එම පුනරුත්ථාපන ක්‍රියාවලියට ඔවුන්ව සහභාගී කරවා ගැනීම නොකල යුතුය.

12 ළමයින් කිසිදු ආකාරයක වෙනස්කමකට හෝ කෲර, අමානුෂික සහ අවමන් සහගත සැළකිල්ලකට හෝ වධහිංසාවකට ලක් නොකළ යුතුය.

13 ළමයින් සම්බන්ධ වාර්තා සහ පෞද්ගලික ලිපිගොනු අතිශයින්ම රහසිගතව සහ සුරක්ෂිතව තබා ගත යුතු අතර නිසි බලධරයාගේ නියෝගයෙක් හැර එම වාර්තා සහ ලිපි ගොනු තෙවන පාර්ශවයකට ලබා නොදිය යුතුය.

14 ළමයා සම්බන්ධ වූ සිද්ධිමය කරුණු පිළිබඳව රහස්‍යභාවය හා ආරක්ෂාව ඇතිවන පරිදි කටයුතු කල යුතුය.

15 අධ්‍යාපනය මගින් පුද්ගල හැකියාවන් වර්ධනය කිරීම මෙන්ම සංස්කෘතික, සදාචාර, සිරිත් විරිත් වල වැදගත්කම වටහාදීම කල යුතුය.

16 ආයතනගත කිරීම පුනරුත්ථාපන ක්‍රියාවලිය සහ නැවත සමාජගත කිරීම යන සෑම අවස්ථාවකදීම ළමාවිය ආරක්ෂා වන පරිදි කටයුතු කල යුතුය

17 ළමයින් සහ යෞවනයින්ගේ ආරක්ෂාවට පවතින සියළු ආකාරයේ තර්ජනයන් පිළිබඳ අවබෝධයෙන් යුතුව ඔවුන්ට උපරිම ආරක්ෂාව ලබාදිය යුතුය.

18 බාලක යුක්ති ක්‍රියාවලියේදී දිනන්නන් හෝ පරදින්නන් නොසිටිය යුතු අතර කිසි විටකත් බන්ධනාගාරගත කිරීම නොකල යුතුය.

19 හැකි සෑම අවස්ථාවකදීම දෙමාපියන් සහ භාරකරුවන් ඇතුළු බාහිර පාර්ශවයන් සමග සම්බන්ධතා පැවැත්වීමට ඉඩ ප්‍රස්ථා ලබා දිය යුතුය.

20 ළමයාගේ යුක්තිය සහ ගරුත්වය ආරක්ෂා කිරීම උදෙසා සියළු ආයතනයන් සහයෝග - යෙන් සහ අන්‍යෝන්‍ය එකඟත්වයෙන් යුතුව කටයුතු කල යුතුය

21. ළමා අධිකරණ ක්‍රියාවලිය සඳහා උපරිම දායකත්වය ලබාදිය යුතුය.

22. ළමයින් ආයතනගත කිරීමේ දී සහ සමාජගත කිරීමේ දී පෙර/පසු විපරම් සිදුකල යුතුය.

## II වන කොටස :
# පොලිස් නිලධාරීන්

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව විසින් 1979 දී ළමා හා කාන්තා කාර්යාංශය ආරම්භ කරන ලදි. මේ වනවිට දිවයිනපුරා සහකාර පොලිස් අධිකාරිවරුන්ගේ අධීක්ෂණය යටතේ මෙම කටයුතු ක්‍රියාත්මක වේ. බොහෝවිට කාන්තා පොලිස් නිලධාරිනියන් මෙම අංශයට අනුයුක්තව කටයුතු කරනු ලබන අතර පොලිස් නිලධාරීන් විසින් කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ළමයකු විෂයගත වන අවස්ථාවක විමර්ශන කටයුතු අදාල පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශය මඟින් කළ යුතුය. එසේම ඒ සම්බන්ධව ළමාරක්ෂක අධිකාරියේ සහාය ලබාගැනීම කල යුතුය.

02 ගැහැණු ළමයකු නම් කාන්තා නිලධාරීන් භාරයට පත් කල යුතුය.

03 ළමයින් කිසිදු අවස්ථාවකදී සිරමැදිරි තුළ රඳවා තබාගැනීම නොකල යුතුය.

04. ප්‍රශ්නගත වූ සිද්ධිය සම්බන්ධයෙන් පැහැදිලිව සහ සරලව ළමයාට අවබෝධකර දිය යුතුය.

05. ළමයාගේ දෙමව්පියන්ට හෝ භාරකරුට නොපමාව දැනුම් දීම කල යුතුය.

06. ළමයාගෙන් ප්‍රශ්න කිරීම ඒ සඳහා විශේෂ පුහුණුව ලත් නිලධාරීන් විසින් සිදුකිරීම කල යුතුය.

07. විශේෂ අවශ්‍යතා ඇති ළමුන් විෂයගත වන අවස්ථාවලදී ඒ සඳහා සුදුසු විශේෂ ප්‍රතිපාදනයන් අනුගමනය කල යුතුය.

08. ළමයාගෙන් පැහැදිලි කර ගැනීම් වලදී, එය නැවත නැවතත් කිරීම වැළැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේද යොදාගැනීම හැකිතාක් දුරට කල යුතුය.

09 අදාළ දරුවා සම්බන්ධ විමර්ශන කටයුතු හැකි ඉක්මනින් නිමකළ යුතු අතර, දරුවා පොලිස් ස්ථානයේ රඳවා ගැනීමේ කාලය අවම කල යුතුය.

10. අපරාධ නඩු විධාන සංග්‍රහය ප්‍රකාර ඇප දිය හැකි වරදක් නම් අප්‍රමාදව පොලිස් ඇප ලබාදීමට ක්‍රියා කල යුතුය.

11. පොලිස් ඇප මත ඇප දීම හෝ මුදා හැරීම සුදුසු නොවන අවස්ථාවක ළමයා හෝ යොවනයා අධිකරණය වෙත ඉදිරිපත් කරන තෙක් නීති ප්‍රකාරව ආරක්ෂිත ස්ථානයක රඳවා තබා ගත යුතුය.

12. ළමුන් සම්බන්ධව අදාල පොලිස් තොරතුරු පොත් සහ ලේඛන වෙනම පවත්වාගෙන යා යුතුය.

13 ළමයාව දෙමව්පියන්ට / භාරකරුවන්ට / යම් ඥාතියෙකුට සෑම විටම භාර කළයුතු අතර, භාරදීම කළ නොහැකි විශේෂ අවස්ථා වලදී අධිකරණ නියෝග මත ළමා රැඳවුම් නිවාසයක හෝ රෝහලක තැබිය යුතුය.

14. අසනීප හෝ තුවාල ලැබූ ළමයින් සිටී නම් ප්‍රතිකාර ලබාදිය යුතුයි. රෝහල්ගත කරන්නේ නම් එහිදී අවශ්‍ය ආරක්ෂාව තහවුරු කල යුතුය.

15. අවශ්‍ය විටකදී දරුවා අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා වෙත යොමු කර වාර්තා ලබාගැනීම කල යුතුය.

16. ළමයා වැඩිහිටි අපරාධකරුවන්ගෙන් වෙන් කර තබා ගත යුතුය.

17. අවශ්‍යතාවය පරිදි ළමයාගේ පවුලේ ආරක්ෂාව සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය පියවර ගත යුතුය.

18. ළමා ශ්‍රමිකයින් පිළිබඳ ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කම්කරු නිලධාරී දැනුවත් කිරීම කල යුතුය.

19. පොලිස් නිලධාරියෙකු විසින් කවර හෝ චෝදනාවක් මත ළමයෙකු හෝ යෞවනයෙකු අධිකරණයට ඉදිරිපත් කිරීමේදී අදාළ පරිවාස නිලධාරීගේ හෝ කම්කරු නිලධාරීගේ වාර්තාව සමග ඉදිරිපත් කල යුතුය.

20. විමර්ශන වාර්තා අධිකරණයට ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදීම අධිකරණයට දරුවා ඉදිරිපත් නොකල යුතු අතර අධිකරණ නියෝගයක් ඇති නම් පමණක් ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

21. ළමයකුගේ පැමිණිල්ලක් විභාග කරන අවස්ථා වලදී ළමයාගේ දෙමාපියන් / භාරකරු හැකිතාක් දුරට අධිකරණයට කැඳවා ගැනීමට කටයුතු කල යුතුය.

22. ළමයකුගේ නඩු කටයුත්තක් පවත්වන සෑම අවස්ථාවක දීම අධිකරණ ශාලාවේ රැඳී සිටින අදාළ නොවන පාර්ශවයන් ඉවත් කිරීමට අධිකරණයේ සහාය ලබාගත යුතුය.

23. ළමයා නැවත සමාජගත කිරීම සඳහා අවශ්‍ය සහාය අදාළ පාර්ශවයන් වෙත ලබා දිය යුතුය.

24. ළමයා සමාජගත කිරීමෙන් අනතුරුව සිදුකරන පසු විපරම් කටයුතු වලට සහාය දිය යුතුය.

# III වන කොටස :
# පරිවාස නිලධාරීන්

1956 දී පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇත. එහිදී අපචාරී ළමුන් සහ යොවනයින් සම්බන්ධයෙන් සහානසිලි අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, එම ළමුන්ට සේවා සැපයීම, පවුල සමග විපත්වීමට අවස්ථාව සැලසීම සහ ආරක්ෂාව සැලසීම, ළමයින් කුලවැද්දීමේ කටයුතු සහ පොදුවේ ළමයින්ගේ අයිතිවාසිකම් රැකගැනීම පෙරදැරිව මෙම ආයතනය ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකාවේ සියළු අධිකරණ කලාප ආවරණය කරමින් දිවයින පුරා පරිවාස කාර්යාල ක්‍රියාත්මක වේ. 1987 දී ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් පරිවාස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය පළාත් මට්ටමට විමධ්‍යගත කරන ලදි. ඒ අනුව පරවාස නිලධාරීන් පළාත් බඳ පරිවාස කොමසාරිස් වරයා යටතේ වර්තමානයේදී කටයුතු කරනු ලැබේ. පරිවාස නිලධාරීන් විසින් කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ස්වාධීන විමර්ශනයක් පවත්වා ගෙන යෑමට පියවර ගත යුතුය.

02. අනාවශ්‍ය තොරතුරු සම්බන්ධ ප්‍රශ්න කිරීම් සහ විමර්ශනය කිරීම් සිදුකරන අවස්ථාවේදී ළමයාගේ හා දෙමාපියන්ගේ ගෞරවය ආරක්ෂා වන පරිදි කටයුතු කල යුතුය

03. ළමයාගේ සමාජ හා පවුල් පසුබිම පිළිබඳව පැහැදිලි විමර්ශනයක් කොට සමාජ විමර්ශන වාර්තාව සකසා අධිකරණයට ඉදිරිපත් කල යුතුය.

04. වාර්තා සකස් කිරීමට අවශ්‍ය විටදී ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී සහ අදාල වෙනත් නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය.

05. තම බල ප්‍රදේශය තුල ඇති නේවාසික මධ්‍යස්ථාන පිළිබඳ මනා අවබෝධයකින් සිටිය යුතු අතර අධිකරණය නියෝග කරන සෑම අවස්ථාවකදීම ඒ පිළිබඳ පැහැදිලි වාර්තාවක් අධිකරණයට ලබාදිය යුතුය.

06. පොලිසිය විසින් ඉදිරිපත් කර ඇති අදාළ දිනය/වේලාව/ස්ථානය තුළ කරන ලද චෝදනා සම්බන්ධයෙන් පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

07. පොලිසිය මගින් ළමයා පිළිබඳ කටයුතු කර අවස්ථා වලදී උපරිම සහාය ලබාදිය යුතුය.

08. මහේස්ත්‍රාත්වරයා විසින් ළමයා සම්මුඛ සාකච්ඡාවට ලක්කිරීමට අවශ්‍ය යැයි නියෝග කළ විට ඒ සෑම අවස්ථාවකදීම සහාය දැක්විය යුතුය.

09. ආයතනය, ළමයින් සහ ඔවුන්ගේ පවුල් අතර සම්බන්ධතා ආරක්ෂා කල යුතුය.

10. ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථාන වල සිටින ළමයින් සෑම මසකම නිරීක්ෂණය කළ යුතු අතර වාර්තා සකස්කර අදාළ ආයතන වෙත ඉදිරිපත් කල යුතුය.

11. ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයේ සිටින ළමයින් මසකට පසුව (සම්මුඛ සාකච්ඡා සහ සමාජ වාර්තා පදනම් කරගෙන)
   1. දෙමාපිය/භාරකරුවෙන්ගේ භාරය, රැකවරණය සහ භාරකාරත්වයට පැවරීම.
   11. ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයේ තැබීම හෝ
   111. වසරක කාලයක් සඳහා ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් වෙත යොමු කළ යුතුය. යන්න තීරණය කිරීමට අධිකරණයට සහාය විය යුතුය

12. ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථාන වල ළමයකු සිටින විට එය අධීක්ෂණය කර මාසිකව පළාත් බඳ පරිවාස කොමසාරිස්වරයා වෙත වාර්තා ඉදිරිපත් කළ යුතුය.

13. ළමයා වෙනත් දිස්ත්‍රික්කයක පිහිටා ඇති ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයකට මාරුකරන විට එම ආයතනයට අයත් අධිකරණ බල ප්‍රදේශයේ පරිවාස කාර්යාලය වෙත අදාළ සියළු ලිපි ලේඛණයන්, පිටපත් තබාගැනීමෙන් පසුව භාරදිය යුතුය. පුනරුත්ථාපන ක්‍රියාවලිය තුළ පවුල සහ ප්‍රජාව සමග පැවැත්වූ සම්බන්ධතා තවදුරටත් පැවැත්වීමට අවශ්‍ය සහාය අදාළ පරිවාස කාර්යාලය වෙත ලබාදිය යුතුය.

14. අධිකරණය මගින් පනවා ඇති කොන්දේසි පිළිපදින්නේ දැයි විමසා බැලීම.

15. දරුවා නැවත සමාජගත කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම හා පළාත් බඳ කොමසාරිස්වරයාට නොපමාව වාර්තා කිරීම/ උපදෙස් ලබාගැනීම කළ යුතුය.

16. ළමයා පිළිබඳ සමාජ වාර්තා නොපමාව අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය.

17. ළමයාගේ හැසිරීම/මනා පැවැත්ම සහ ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් කර අධිකරණයට වාර්ථා කල යුතුය.

18. ළමයාගේ යහපැවැත්මට අවශ්‍ය උපදෙස් සෑම විටම ලබාදීමට කටයුතු කිරීම කළ යුතුය.

19. ළමයාට අවශ්‍ය සුභසාධනය සහ සුදුසු අධ්‍යාපන ක්‍රමවේදයක් ලැබේ දැයි සොයා බැලිය යුතුය.

20. ළමයින්ගේ ප්‍රගතිය සම්බන්ධයෙන් සොයා බලා සමාලෝචනයක් සිදු කළ යුතුය. එය නිශ්චිත කාලයක් තුලදී සිදුකිරීමට කටයුතු කළ යුතුය. (ළමාරක්ෂක නේවාසික මධ්‍යස්ථානයක නම් මාස 03 කට වරක් ද, ළමාරක්ෂක පුනරුත්ථාපන මධ්‍යස්ථානයක නම් මසකට වරක්ද සමාලෝචනය කල යුතුය)

21. ළමයින් නැවත සමාජගත කිරීමට සහායවීම සහ සමාජගත කරන ලද ළමයා පිළිබඳ නිරන්තර පසු විපරමක් වසරක කාලයක් තුළ කල යුතු අතර ඒ සඳහා අදාළ නිලධාරීන්ගේ සහාය ලබාගැනීම කළ යුතුය.

22. සුදුසු රැකියාවක් හෝ වෘත්තිය කටයුතු වල නියැලීම සඳහා උපදෙස් ලබාදීම කල යුතුය.

23. ළමයා සමාජගත කිරීමේ වෙනත් ආයතන වල සහාය ලබාගත යුතු නම් ඒ පිළිබඳව පළාත් බඳ පරිවාස කොමසාරිස්,පුනරුත්ථාපන කොමසාරිස් සහ පුනරුත්ථා -පන කොමසාරිස් ජනරාල් දැනුවත් කල යුතුය.

# IV වන කොටස :
# ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්

ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් මධ්‍යම රජය යටතේ ක්‍රියාත්මක වන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක වීම සඳහා පත්කර ඇත. මෙම නිලධාරීන්ගේ මූලික කාර්යය ළමා හිමිකම් ප්‍රවර්ධනය කිරීම, වැඩිදියුණු කිරීම හා ආරක්ෂා කිරීම වන අතර මෙකී නිළධාරීන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ළමයාගේ මනා පෞරුෂත්වයත්වයක් ගොඩ -නැංවීමට මග පෙන්වනන්නෙක් විය යුතුය.

02. මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ළමයා පිළිබඳ සම්මුඛ සාකච්ඡාවට කැඳවන අවස්ථාවේ දී පූර්ව සූදානමකින් යුක්තව අධිකරණයට සහාය වීම.

03. පරිවාස නිලධාරීන් විසින් ළමයින් සම්බන්ධයෙන් සකස් කරන වාර්තා වලදී සහාය අවශ්‍ය යැම විටකදීම උපරිම සහාය ලබාදිය යුතුය.

04. ආයතනගත ළමයින් සහ ඔවුන්ගේ පවුල් අතර සබඳතාවය ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා උපකාරී වීම.

05. ළමයා නැවත සමාජගත කිරීමට පූර්ව සූදානමක් සමාජය සහ පවුල තුළ ඇති කල යුතුය.

06. ළමයා නැවත සමාජගත කිරීමට මානසික සහ ශාරීරික වශයෙන් ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය.

07. ළමයාට අහිතකරවන්නා වූ විෂයගත කරුණු වැළැක්වීම සඳහා ඒ සම්බන්ධයෙන් උසස් නිලධාරීන් මගින් අදාල ආයතනයන් වෙත දැනුම්දීම කල යුතුය.

08. ළමයා නැවත සමාජගත කිරීමෙන් අනතුරුව ළමයා පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කළ යුතු අතර අවශ්‍ය වූ විටක පසු විපරම සම්බන්ධයෙන් පරිවාස නිලධාරීන්ට උපරිම සහාය ලබාදිය යුතුය.

## මටත් පාසල් යන්න තිබුණා නම් !!!!!!

අජිත් වයස අවුරුදු 12 ක දෙමව්පියන් අහිමි පිරිමි ළමයෙකි. අජිත් තම මාමා භාරයේ හැදී වැඩුනු අතර පාසල් අධ්‍යාපනය හදාරමින් සිටියදී මාමාගේ කෲරත්වය හා වධහිංසාව පැමිණවීම හේතුවෙන් පොලිසිය විසින් මාමාව අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර බන්ධනාගාර ගත කරන ලදි. දෙමාපියන් අහිමි අජිත් බාලවයස්කරුවෙක් වූ බැවින් ඔහුගේ රැකවරණයට කිසිදු අයෙක් ඉදිරිපත් නොවිය. එහිදී බලධාරීන්ට සිදු වූයේ භාරය හා ආරක්ෂාව සඳහා අජිත්ව ළමා නිවාසයකට යොමු කිරීමට අධිකරණයේ පිහිට පැතීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස අජිත් රජයේ ළමා නිවාසයකට යොමු කරන ලදි. එම නිවාස බලධාරීන් විසින් අජිත්ව පාසලකට ඇතුළත් කිරීමට උත්සාහ කරන ලද නමුත් පාසල් බලධාරීන්ගේ ප්‍රමාදය මත අජිත්ගේ පාසල් අධ්‍යාපනය කඩාකප්පල් විය. පාසල් අධ්‍යාපනය නොලැබීම මානසික පීඩනයට ලක්වූ අජිත් ළමා නිවාසයෙන් පැනගොස් ඇත. පසුව පොලිසිය විසින් අයාලේ යමින් සිටි අජිත්ව තම භාරයට ගෙන නැවතත් අධිකරණයට ඉදිරිපත් කර ළමා නිවර්තන නිවාසයකට යොමු කරන ලදි.

- වින්දිතයෙකු වීම පාසල් අධ්‍යාපනය අහිමිවීමට හේතුවක්ද?
- ළමයාගේ උපරිම යහපත යන සංකල්පය මත පිහිටා අදාළ ආයතන අතර මනා සම්බන්ධීකරණයකින් ක්‍රියාත්මකව විය යුතුව තිබුණේ කෙසේද?

# V වන කොටස :
# කම්කරු නිලධාරීන්

කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු කලාපිය කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල සහ උප කම්කරු කාර්යාල ලෙස ප්‍රාදේශීය මට්ටම කරා විමධ්‍යගතව ක්‍රියාත්මක වේ. කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කේන්ද්‍ර කරගෙන ළමා හා කාන්තා අංශයක් ක්‍රියාත්මක වේ. පොදුවේ ළමයින්ගේ සුරක්ෂිතතාවය පිළිබඳව විමසීමේදී කම්කරු දෙපාර්තමේන්තුව ළමයින් සහ තරුණයින් සේවයේ යෙදවීම පිළිබඳව වැඩි සැලකිල්ලකින් කටයුතු කරනු ලැබේ. ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලබන කම්කරු නිලධාරීන් විසින් කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ළමයා සම්බන්ධයෙන් පැමිණිල්ලක් ලැබුණ විගසම පොලිසිය දැනුවත් කළ යුතුය.

02 ළමයා සම්බන්ධයෙන් ප්‍රශ්ණගත වූ ස්ථානීය පරීක්ෂණයේ දී වඩාත් සියුම් ලෙස සුපරීක්ෂාකාරීව සිදු කල යුතුය.

03. ස්ථාන පරීක්ෂණය සිදු කරන වේලාව පිළිබඳව සැළකිලිමත් විය යුතුය.

04. ළමයාගේ දෙමව්පියන්ට හෝ භාරකරුට නොපමාව දැනුම් දීම කලයුතුය.

05. ගැහැණු ළමයකු විෂයගත අවස්ථාවක ස්ථානීය පරීක්ෂණය සඳහා කාන්තා පොලිස් නිලධාරිණියකගේ සහභාගීත්වය තහවුරු කර ගත යුතුවේ.

06. ළමයකුගේ පැමිණිල්ලක් විභාග කරන අවස්ථා වලදී ළමයාගේ දෙමාපියන්/ භාරකරු හැකිතාක් දුරට අධිකරණයට කැඳවා ගැනීමට කටයුතු කල යුතුය.

07. අසනීප හෝ තුවාල ලැබූ ළමයින් සිටී නම් ප්‍රතිකාර ලබාදීමේ කටයුත්ත නිසි පරිදි සිදු කිරීම තහවුරු කරගත යුතුයි.

08. ළමයාගේ පැහැදිලි කර ගැනීම් වලදී එය නැවත නැවත කිරීම වැළැක්වීම සඳහා නවීන තාක්ෂණ ක්‍රමවේද යොදාගැනීම හැකිතාක් දුරට කල යුතුය.

09. ළමයකුගේ නඩු කටයුත්තක් පවත්වන සෑම අවස්ථාවක දීම අධිකරණ ශාලාවේ රැඳී සිටින අදාළ නොවන පාර්ශවයන් ඉවත් කිරීමට අධිකරණයේ සහාය ලබාගත යුතුය.

10. නඩු කටයුත්තට අවශ්‍ය සියලු ලේඛණ සහ තොරතුරු අදාළ ආයතනයන්ගෙන් නොපමාව ලබාගෙන නොපමාව නඩු පැවරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය.

11. ප්‍රාදේශීය ළමා අධීක්ෂණ කමිටු සඳහා උපරිම දායකත්වය ලබාදිය යුතුය.

12. හැකි සෑම විටම ළමා ශ්‍රමයේ අහිතකර ඵල පිළිබඳ සමාජයේ විවිධ කණ්ඩායම් දැනුවත් කිරීම කල යුතුය.

13. ළමයා සමාජගත කිරීමෙන් අනතුරුව සිදුකරන පසු විපරම් කටයුතු වලට සහායවීම.

## මගේ අනාගතය ?????

මට අහිමි අවුරුදු 15 ක් වයසැති සෙල්වරාජාගේ පියා බහුදින යාත්‍රාවක සේවය කරන ධීවර කාර්මිකයෙකි. සෙල්වරාජා සිය වයෝවෘද්ධ මිත්තනිය සමග දිවි ගෙවන්නේය. එක් දිනක සිය මිතුරන් සමග සෙල්ලම් කරමින් සිටියදී යාබද නිවසක වත්තකට ඇතුළු වී වැටී තිබූ පොල් ගෙඩි 04 ක් ඇහිඳ ගනී. මේ සම්බන්ධයෙන් උරන වූ වතුහිමිකාරිය ඔහු පොලිසියට අල්ලා දෙන ලදී. පොලිසිය විසින් සෙල්වරාජා අධිකරණයට ඉදිරිපත් කරන ලද අතර ඔහු වෙනුවෙන් දෙමාපියන් හෝ භාරකරුවකු ඉදිරිපත් නොවූ බැවින් ඔහුව පුනරුත්ථාපනය ආයතනයක් වෙත යොමු කරන ලදී. එම ආයතනය පිහිටි භූමියේම වැඩිහිටි වරදකරුවන්ගේ විශෝධන මධ්‍යස්ථානයක් ද පිහිටා ඇත. එහි ගැවසුණු වැඩිහිටි වරදකරුවන්ගේ වැරදි ක්‍රියාකලාප ආදර්ශයට ගැනීමට සෙල්වරාජා මැළි නොවීය.

- මේ ළමයා මෙවැනි පෙළඹවීමකට ලක්වූයේ ඇයි ?
- මෙහිදී නිසි පුනරුත්ථාපනයක් ලැබෙන්නේ දැයි සිතන්නේ ද? රජයට සහ සමාජයට ඇති වගකීමට කුමක්වීද?!

# VI වන කොටස :
# ජාතික ළමාරක්ෂක අධිකාරියේ නිලධාරීන්

1998 අංක 50 දරන ජාතික ළමාරක්ෂක අධිකාරි පනත මගින් මෙම ආයතනය පිහිටුවා ඇත. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශය ආරම්භවීමත් සමගම ජාතික ළමාරක්ෂක අධිකාරිය එම අමාත්‍යාංශය යටතට ගැනුනි. දිස්ත්‍රික් මට්ටමින් මෙම ආයතනයේ නිලධාරීන් දිවයිනපුරා ක්‍රියාත්මක වන අතර, ඔවුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල කේන්ද්‍ර කරගෙන තම කටයුතු මෙයෙහවීම සිදු කරනු ලැබේ. ළමයින්ට සිදුවන සියළු ආකාරයේ අපචාර වැළැක්වීම සහ අපචාර වලට ගොදුරු වූ ළමයින් ආරක්ෂා කිරීම සහ ප්‍රතිකර්ම සැළැස්වීම ඇතුළු ළමා අපචාර ක්‍රියාවන්ට එරෙහි වූ ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය සහ නියාමනය කිරීම ජාතික ළමාරක්ෂක අධිකාරියේ වගකීමක් වන හෙයින් ජාතික ළමාරක්ෂක අධිකාරියේ නිලධාරීන් සහ ප්‍රාදේශිය සම්බන්ධීකාරක නිලධාරීන් විසින් කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ළමා අපයෝජන පිළිබඳව ලිඛිත වාචික පැමිණිලි නිවැරදිව සටහන් කර ගැනීම සහ ඒ පිළිබඳව නොපමාව ප්‍රධාන කාර්යාලය වෙත හෝ ආසන්නතම පොලිස් ස්ථානය වෙත දැනුම්දීම කල යුතුය.

02. ළමා අපයෝජන පිළිබඳ පොලිස් නිලධාරීන් කරනු ලබන සියළු කාර්යයන් පිළිබඳ නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කල යුතුය.

03. පොලිස් විමර්ශන කටයුතු නිසි ලෙස සිදු නොවන බවට හේරුම් ගිය විට නොපමාව අධිකාරියේ සභාපතිවරයාට දැනුම් දී අවශ්‍ය කටයුතු කල යුතුය.

04. ළමයා අධිකරණ වෛද්‍ය නිලධාරීයාට යොමුකිරීම සහ මනෝවෛද්‍යවරයා වෙත යොමු කිරීමේ ක්‍රියාවලියේ සිට එකී වාර්තා ලැබෙන තෙක් දැඩි අධීක්ෂණයකින් යුක්තව කටයුතු කල යුතුය.

05. පරිවාස නිලධාරීන් විසින් ළමයින් සම්බන්ධයෙන් සකස් කරන වාර්තා වලදී සහාය අවශ්‍ය සෑම විටකදීම උපරිම සහාය ලබාදිය යුතුය.

06. මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ළමයා පිළිබඳ සම්මුඛ සාකච්ඡාවට කැඳවන අවස්ථාවේ දී පූර්ව සූදානමකින් යුක්තව අධිකරණයට සහාය වීම.

07. අපයෝජනයට ලක් වූ දරුවාගේ දෙමාපියන් හා භාරකරුවන් සමග සිද්ධියට අදාලව ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීම සහ වෛද්‍ය ප්‍රතිකර්ම සඳහා යොමුවීමට උනන්දු කරවිය යුතුය.

08. ළමයා නැවත සමාජගත කිරීමට මානසික හා ශාරීරික වශයෙන් ශක්තිමත් කිරීමේ ක්‍රියාවලියට සහාය විය යුතුය.

09. ළමයා නැවත සමාජගත කිරීමෙන් අනතුරුව පරිවාස නිලධාරීන් සිදුකරන පසු විපරම් කටයුතු සඳහා උපරිම සහාය ලබාදිය යුතුය.

10. විෂයගත වූ ළමයා නැවත සමාජගත කිරීමෙන් අනතුරුව ඔහුගේ පවුලේ සමාජ ආර්ථික වැඩි දියුණුව සඳහා ආයතනික මට්ටමින් ලබාදිය හැකි උපරිම දායකත්වය ලබාදීමට මැදිහත්විය යුතුය.

11. ළමා අයිතිවාසිකම් සම්බන්ධ බිම් මට්ටමේ කමිටු පිහිටුවීම සහ එමගින් ළමා අපයෝජනයන් වැලැක්වීම සඳහා ක්‍රියාකාරී දායකත්වයක් ලබාගැනීමට කටයුතු කිරීම කල යුතුය.

12. දිස්ත්‍රික් ළමා ප්‍රවර්ධන කමිටුව සහ දිස්ත්‍රික් ළමා ආරක්ෂක ඒකකය වෙත උපරිම දායකත්වය ලබාදිය යුතු අතර එමගින් ළමුන් පිලිබඳ ගන්නා තිරණයන් සහ කරනු ලබන ක්‍රියාකාරකම් අධීක්ෂණය කල යුතුය.

13. හැකි සෑම විටම ළමා අපයෝජනයේ අහිතකර ඵල පිළිබඳ සමාජයේ විවිධ කණ්ඩායම් දැනුවත් කිරීම කල යුතුය.

# VII වන කොටස :
# ළමා නිවාස/පුනරුත්ථාපන මධ්‍යස්ථානභාර නිලධාරීන්

මධ්‍යම ආණ්ඩුවේ පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව, පළාත්බද පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තු සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව යටතේ ළමා නිවාස සහ පුනරුත්ථාපන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ. මෙම ආයතනයන්හි කටයුතු පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ ක්ෂේත්‍රයන් ආවරණය කරමින් නිලධාරීන් ක්‍රියාත්මක වන ආකාරයක් දක්නට ඇත. ළමයින් ආයතනගත වීමෙන් අනතුරුව සිදුකරන රැකවරණ/පුනරුත්ථාපන හා නිවැරදි කිරීමේ ක්‍රියාවලියේදී ආරක්ෂාව, මනා පුහුණුව, නිවැරදි උපදෙස්, මඟපෙන්වීම, විනය හා සදාචාරය යන කරුණු සංකලනයකින් යුක්තව දරුවා නැවත සමාජගත කිරීමට අවශ්‍ය හැඩගැස්වීම් වලට සෘජුවම දායක වන නිලධාරීන් විසින් කටයුතු කිරීමේ දී අනුගමනය කළ යුතු මාර්ගෝපදේශය :-

01. ළමයාට ආචාරශීලී සහ කරුණාවෙන් සැළකිය යුතුය.

02. ආයතනයේ සිටින සියලු ළමයින් පිළිබඳ සවිස්තරාත්මක ලේඛනයක් පවත්වාගෙන යාම කළ යුතුය.

03. ආයතනයතුළ ළමා හිතකාමී පරිසරයක් පවත්වාගෙන යායුතුය.

04. ළමයාගේ දවස ගෙවීමේ කාල සටහන් විනය හා නිරෝගී වර්ධනයට උචිත වන පරිදි සැකසිය යුතුය.

05. එක් එක් ළමයා සෙසු නේවාසිකයින්ගේ කායික හෝ මානසික පීඩාවකට ලක් නොවන පරිසරයක් නිර්මාණය කළ යුතුය.

06. ආයතනගත කළ පසු හදිසි වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය නම් ඒවා කඩිනමින් ලබාදිය යුතුය.

07. ළමයාට නිසි ආරක්ෂාවක් ලබාදීම කළ යුතුය.

08. ළමයාගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු පවතින බව ළමයා පවසන්නේ නම් ඒ පිළිබඳ අදාළ පාර්ශවයන් දැනුවත් කිරීම.

09. ළමයාට පෝෂ්‍යදායි සහ ප්‍රමාණවත් ආහාර වේලක් ලබාදීම කළ යුතුය.

10. අවශ්‍ය ජලය සහ සනීපාරක්ෂක පහසුකම් නිසි පරිදි ලබාදීම කළ යුතුය.

11. ක්‍රීඩා වලට සහ විනෝදාත්මක කටයුතු සඳහා නිසි පරිදි පහසුකම් ලබාදීම කළ යුතුය.

12. ළමයාගේ මානව ගරුත්වය රැකෙන පරිදි ප්‍රමාණවත් ඇඳුම් ලබාදීම කළ යුතුය.

13. නිදාගැනීමට ප්‍රමාණවත් ඉඩක් ලබාදීම කළ යුතුය.

14. ළමයාගේ වර්ධනයට හිතකර වූ භෞතික පරිසරයක් නිර්මාණය කළ යුතුය.

15. කාලීන අවශ්‍යතාවය සඳහා ගැලපෙන පරිදි වෘත්තීය අධ්‍යාපන කටයුතු සඳහා යොමු කිරීම කළ යුතුය.

16. ළමයාට තම ආගම සහ සංස්කෘතික කටයුතු වල නිරතවීම සඳහා ඉඩක් ලබාදීම කළ යුතුය.

17. ළමයාට දෙමාපිය භාරකරුවන් සමඟ සන්නිවේදන කිරීමට සහ එකිනෙකා මුණගැසීමට අවස්ථාව ලබාදිය යුතුය

18 ආයතනගත ළමයින්ගේ ආරක්ෂාව සහ වැඩිම යහපත වෙනුවෙන් කටයුතු කළ යුතුය. ළමයා සමග ඔහුගේ පවුලේ සාමාජිකයින් අතර සම්බන්ධතා තහවුරු කිරීමට කටයුතු කළ යුතුය.

19. ළමුන්ට අධ්‍යාපනය සඳහා පාසැල් යාමට ඉඩකඩ සලසා දිය යුතුය.

20. අවිධිමත් ලෙස අධ්‍යාපනය ලැබූ දරුවන් හට මූලික අධ්‍යාපනය ලබාදීම සඳහා විශේෂ ක්‍රමවේදයක් සැකසීම කළ යුතුය.

21. විශේෂ දක්ෂතා ඇති ළමුන් සම්බන්ධයෙන් තොරතුරු ලබාගැනීමට හා සහභාගී වීමට ප්‍රවේශයන් ඇති කළ යුතුය.

22. විශේෂ ශාරීරික අවශ්‍යතා ඇති දරුවන්හට සුදුසු විශේෂ පහසුකම් සහ රැකවරණ ලබාදීම සිදු කළ යුතුය.

23. විශේෂ ශාරීරික අවශ්‍යතා ඇති දරුවන්හට වෘත්තීය පුහුණු වැඩසටහන් ඇති කිරීම.

24 කිසිදු අවස්ථාවක ළමයින් ආයතනගත වූවන් ලෙස අදහසක් ඇති කිරීමට හෝ බන්ධනාගාර රැඳවියන් ලෙස ඇතිවන හැඟීම ඇති නොකළ යුතුය.

25. ආයතන කළමණාකරන කටයුතු සඳහා ළමයාගේ විෂය ගත වූ කරුණු සම්බන්ධයෙන් මනා අවබෝධයකින් කටයුතු කළ යුතු අතර කිසි ලෙසකින් දරුවන්ට ඒ පිළිබඳව දැනීමක් සිදු නොවීමට කටයුතු කළ යුතුය.

26. ආයතනගත ළමයාගේ, ආයතනගත කර ඇති කාලය, රඳවා ඇති ස්ථානය. ඔහුගේ/ඇයගේ පවුල පිළිබඳ තොරතුරු පරිවාස කොමසාරිස්/පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් වෙත වාර්තා කළ යුතුය.

27 අධිකරණ නියෝග මත ළමයින්ව වෙනත් ආයතන වෙත මාරු කරන විට ඒ පිළිබඳ දෙමාපියන්/ භාරකරුවන්/ පොලිසිය/පරිවාස නිළධාරීන්/ ජාතික ළමාරක්ෂක අධිකාරියේ ප්‍රාදේශීය සම්බන්ධීකාරක/පළාත් බද පරිවාස කොමසාරිස් සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් දැනුවත් කළ යුතුය.

28. අදාළ මාරු කිරීම් වලදී ළමයාට අදාළ සියළු ලිපි ගොනු වල පිටපත් තබාගෙන අදාළ ආයතනය වෙත ලබා දිය යුතුය.

29. අධිකරණ නියෝග මත රැඳවා සිටින දරුවන්ගේ රැඳවීම ප්‍රශ්ණගත අවස්ථාවක ඒ පිළිබඳව නොපමාව ළඟම ඇති පොලිසියට අදාළ ප්‍රශ්නය යොමු කිරීමෙන් හෝ නීතිපතිවරයාට හෝ අධිකරණයට යොමු කිරීමෙන් සහනයක් ලබා ගත යුතුය.

30. ළමයාගේ සෞඛ්‍ය තත්වය පිළිබඳ නිරන්තරව සොයා බැලීම සිදුකර, අවශ්‍යතා අනුව මානසික උපදේශනය සහ වෙනේ වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම කළ යුතුය.

31. ළමයාගේ ප්‍රගතිය පිළිබඳව වාර්තාවක් පවත්වාගෙන යාම සහ ළමයාගේ ප්‍රගතිය නිරන්තර සමාලෝචනය කළ යුතුය.

32. ළමයාගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් පළාත් බද පරිවාස කොමසාරිස්වරයාට සහ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල්වරයා දැනුවත් කළ යුතුය.

33. ළමයා නැවත සමාජගත කිරීමට අනෙකුත් සම්බන්ධිත නිලධාරීන්ගේ සහාය ලබාගැනීම කළ යුතුය.

වගකීම් දරන්නන්ගේ ..............................

කැපවීම

විශ්වාසය

අවංකත්වය

එකඟතාවය

සහයෝගය

සම්බන්ධීකරණය

දරුවන්ට යහපත් මාවතක් උදාකරයි !

# சிறுவர்களின்

## அதியுயர் நலனை உறுதிப்படுத்துவோம்

## சிறுவர்களின் அதியுயர் நலனை உறுதிப்படுத்துவோம்

எல்லா விதமான நிறுவனமயப்படுத்தப்பட்ட மற்றும் நிறுவனமயப்படுத்தப்படாத சிறுவர்கள் தொடர்பில் பணியாற்றுகின்ற அரச அதிகாரிகள் செயற்படவேண்டிய முறைமை தொடர்பான பொது வழிகாட்டல் விதிமுறைகள்

# முன்னுரை

2008 ஆம் ஆண்டு டிசம்பர் மாதம் நடைபெற்ற ஐக்கிய நாடுகள் சபையின் அனைத்துலக மனித உரிமைகள் பிரகடனத்தின் 60 வது நினைவுகூர்தலை கருத்திற்கொண்டு, சிறுவர் உரிமைகளைப் பாதுகாப்பதற்கான புதிய செயற்பாட்டுத் திட்டத்திற்கமைவாக 18 வயதுக்குக் கீழ்ப்பட்ட ஆட்களை நீதி மன்ற கட்டளையின் மூலம் ஏதேனும் நிபந்தனையின் அடிப்படையில் நிறுவன மயப்படுத்தப் படுபவர்கள் தொடர்பாக விசேட கவனஞ் செலுத்தப்பட்டது.

அத்துடன், சிறுவர் - நீதியை நிலைநாட்டும் போது, அமுலாக்கல் தாபனங்களில் காணப்படுகின்ற தொழில்நுட்பக் குறைபாடுகள், சட்டம் பற்றிய அறிவு மற்றும் சர்வதேச ரீதியாக ஏற்றுக் கொள்ளப்பட்டுள்ள தராதரங்கள் பற்றிய தெளிவு என்பன காலத்திற்கேற்ற விதத்தில் இல்லாத காரணத்தால் 18 வயதுக்குக் கீழ்ப்பட்ட நிறுவனமயப் படுத்தப்படுகின்ற சிறுவர்கள் நிறுவனமயப் படுத்தப்படுவதன் நோக்கத்தை அடைந்து கொள்ளாமைக்கான காரணி கள் தொடர்பாக விசேட கவனஞ் செலுத்தி ஆராயப் பட்டது.

முழுமையாக நோக்குகையில், யாழ்ப்பாணம் மற்றும் நீர்கொழும்பு ஆகிய இடங்களில் அமைந்துள்ள சிறுவர் தடுப்பு நிலையங்களையும், ஏனைய சிறுவர் தடுப்பு நிலையங்களையும் மேற்பார்வை செய்ததன் மூலம் தென்பட்ட பிரச்சனைகளுக்குரிய நிலைமைகளைப் புரிந்து கொண்டு, சிறுவர்களின் அதியுயர் நலனுக்காக சிறுவர் தொடர்பில் செயற்படுகின்ற அரச அதிகாரிகளுக்கு அறிவை வழங்க வேண்டியதுடன், சிறுவரின் உள்ளம் மற்றும் சம்பவத்திற் கான ஏதுக்கள் பற்றிய பரந்த அறிவு டனும் புரிந்துணர்வுடனும் செயற்படு வதற்கு அதிகாரிகளின் சொந்த அபிப்பிராயத்தில் மாற்றங்களை ஏற்படுத்த வேண்டியுள்ளது.

அதன்படி சிறுவர் நன்னடத்தை அலுவலர்கள், சிறுவர் உரிமைகளை மேம்படுத்தும் பணியாளர்கள், பொலிஸ் அதிகாரிகள், தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை உத்தியோகத்தர்கள் மற்றும் சிறுவர் இல்லங்கள் மற்றும் புனர்வாழ்வு நிலையங்களில் பணிபுரியும் ஊழியர்கள் ஆகியோரை முன்னோக்கி அவர்களோடு தொடர்பான விடயங்களை நோக்காகக் கொண்டு மனித உரிமைகள் ஆணைக் குழுவின் கண்காணிப்புக்கும் மீளாய்வுக்குமான பிரிவு வழிகாட்டலொன்றைத் தொகுக்க வேண்டிய அவசியத்தை வலியுறுத்த வேண்டியேற்பட்டது.

இதற்காக சிறுவர் தொடர்பில் செயற்படுகின்ற நிறுவனங்கள் அனைத்து நிறுவனங்களிடமும் வழிகாட்டலை தொகுப்பதற்கான கருத்துக்களையும் விடயங்களையும் வினவும் நிகழ்ச்சி நிரல்களின் மூலம் அறிவைப்பெற்று, அவற்றையும் உள்ளடக்கித் தயாரிக்கப் பட்ட வழிகாட்டலை இப் பிரசுரம் மூலமாக வெளியிடுகின்றோம்.

இந்த வழிகாட்டல் சிறுவர் மற்றும் இளைஞர்களின் வாழ்வை மென்மேலும் பயனுள்ளதாக ஆக்குகின்ற நோக்கத்தை அடிப்படையாகக் கொண்டுள்ளதனால், பொதுவான இணக்கத்தின்பேரில் தயாரிக்கப்பட்ட வெறும் ஆவணமாக மாத்திரமல்லாது, மனித இனத்தின் எதிர்காலம் சிறுவர் மீது தங்கியிருப்பதால் அர்த்தமுள்ள வாழ்க்கைக்கு உரித்துடையவர்களாக்குவதற்கு அனைத்து அரச அதிகாரிகளினதும் ஊக்கத்திலும் செயற்பாட்டிலும் செயற்படுத்தப்பட வேண்டியதாகும்.

## பொருளடக்கம்


1. முன்னுரை

2. அறிமுகம்

- இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
- சிறுவர் தொடர்பான சர்வதேச தராதரம்
- சிறுவர் தொடர்பான தேசிய சட்டம்
- சிறுவர் உரிமைகளைப் பேணிப் பாதுகாப்பதற்கான நிறுவனக்கட்டமைப்பு

3. சிறுவர் தொடர்பிலான அரச அதிகாரிகள் செயற்படவேண்டிய முறைமைகள் தொடர்பான பொதுவழிகாட்டல் விதிமுறைகள்

- பகுதி I : பொது வழிகாட்டல்கள்
- பகுதி II : பொலிஸ் அதிகாரிகள்
- பகுதி III : நன்னடத்தை அதிகாரிகள்
- பகுதி IV : சிறுவர் உரிமைகளை மேம்படுத்தும் அதிகாரிகள்
- பகுதி V : தொழில் அதிகாரிகள்
- பகுதி VI : தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை அதிகாரிகள்
- பகுதி VII : சிறுவர் இல்லம் புனர்வாழ்வு நிலையங்களுக்கு பொறுப்பாகவுள்ள அதிகாரிகள்


## அறிமுகம்

இந்த உலகில் பிறந்துள்ள எல்லா சிறுவர்களும் கௌரவம் மற்றும் உரிமைகளைக் கொண்டுள்ளவர்களாகவும் சுதந்திரமானவர்களாகவுமே பிறக்கின்றனர். குழந்தைப் பருவத்தை சுதந்திரமாக கழிக்கும் சிறுவர்களுக்கு சமூக, பொருளாதார, அரசியல் மற்றும் கலாசார சூழ்நிலைகளுக்குள் கட்டுப்பட்டு வாழ நேரிடுகின்றது. இந்த காரணிகளின் சமநிலை சீர்கெடும்போது சிறுவர்களுக்கு கடினமானதும் கசப்பானதுமான அனுபவங்களைப் எதிர் கொள்ள வேண்டியேற்படுகின்றது. இவ்வாறான நிலைமையில் சிறுவர்களின் குழந்தைப்பருவத்தை பாதுகாப்பது, சமூகத்தினதும் அரசினதும் கடமையாகும். நவீன உலகில் துரதிஷ்ட வசமாக சிறுவர்களின் பிள்ளைப்பருவம் வளர்ந்தோர்களினாலும் சமூகத்தினாலும் விகாரப்படுத்தப்படுவதன் காரணமாக இன்றைய சமூகத்தில் சிறுவர்கள் கசப்பான அனுபவங்களைப் பெறும் நிலைமை அதிகரித்துச் செல்கின்றது. அவ்வாறான சூழ்நிலைகளில் நிறுவன மயப்படுத்தப்படும் சிறுவர்கள் தொடர்பில் பெற்றோர், சமூகம் மற்றும் அரசுக்கு பல்வேறு பொறுப்புக்கள் உள்ளன. நிறுவன மயப்படுத்தப்பட்ட சிறுவர்களை நல்ல பிரஜைகளாக நிறுவனத்திலிருந்து வெளியேற்றும் நோக்கத்துடன் அல்லது அரசின் பலதுறைகளினால் (அரச கருவிகளினால்) மேற்கொள்ளப்பட்ட பாதுகாப்பு மற்றும் வளர்ச்சி தொடர்பான செயற்பாடுகள் ஆகிய சிறுவர்களின் நலனுக்காக செய்த செயற்பாடுகள் எதிர்பார்த்த இலக்கையடைய தவறியுள்ளன.

நாட்டின் எதிர்காலத்தை பொறுப்பேற்கவுள்ள இவ்வாறான சிறுவர்களைப் பாதுகாப்பதற்கு கொண்டுவரப்பட்ட சர்வதேச பிரகடனங்கள், சமவாயங்கள் மற்றும் தராதரங்கள் என்பன அரசினால் ஏற்றுக் கொள்ளப்பட்டிருப்பதுடன், அந்த தராதரங்களும் கொள்கைகளும் தேசிய கட்டமைப்புக்கு ஏற்றவகையில் நியதிச்சட்டங்களாகவும் செயற்படுகின்ற நிறுவனங்களாகவும் தாபிக்கப்பட்டுள்ளன. ஆனால், ஏற்பட்டுள்ள நன்மைகள் தொடர்பாக ஆராயும்போது, இத்தகைய சட்டங்களும் நிறுவனங்களினால் ஆற்றப்படுகின்ற சேவைகளும் சிறுவர்களின் அதியுயர் நலனைப் பாதுகாப்பதிலான பங்களிப்புக்கள் குறைந்துள்ளன. சட்ட அறிவு காலத்திற்கு பொருத்தமற்றதாக இருப்பதாலும், விசேட பயிற்சி வழங்கப்படாமையினாலும், காலங்கடந்த கருத்துக்கள் காணப்படுவதனாலும் மற்றும் அவசியத்தினை விஞ்சு கடமையைச் செய்யாமலிருக்கின்றமையினாலும் நிறுவனங்களிடையேயான உள்ளார்ந்த தொடர்பும் வீழ்ச்சியடைந்துள்ளது. ஆகவே, சிறுவர்களின் எதிர்காலந் தொடர்பாகத் தீர்மானிக்கும்போது சிறுவர்களின் அதியுயர் நலனுக்காக செயற்பட வேண்டிய பலத்த தேவை ஏற்பட்டுள்ளது.

இவ்வாறான சூழ்நிலைகளில் சிறுவர் தொடர்பில் செயற்படுகின்ற அரச அதிகாரிகள் செயற்படவேண்டிய முறைமை பற்றிய அறிவுறுத்தல் வழிகாட்டிகளின் அவசியம் மனித உரிமைகள் ஆணைக்குழுவினால் செய்யப்பட்ட ஆய்வின் போது புலப்பட்டது. அதன்படி, கீழே விபரமாகக் குறித்துரைக்கப்பட்டுள்ளதன்படி, சிறுவர் தொடர்பான சர்வதேச, தேசிய சட்டம் மற்றும் அரச நிறுவனங்களின் நோக்கம் மற்றும் செயற்பாடுகள் என்பவற்றை நன்கு அறிந்து கொண்டு சிறுவர்களுடன் தொடர்புடைய அரச அதிகாரிகள் செயற்பட வேண்டும் என்பதே மனித உரிமைகள் ஆணைக் குழுவின் நோக்கமாகும்.

இந்த வழிகாட்டல் விதிமுறைகள், சிறுவர்களினதும் இளைஞர்களினதும் நல்வாழ்வை மென்மேலும் சிறப்பானதாக ஆக்கும் நோக்கத்தைக் கொண்டு பொது ஒருமைப்பாட்டுடன் தயாரிக்கப்பட்டதொரு வெறும் ஆவணமாக மட்டுமல்லாது, மனித வர்க்கத்தின் எதிர்காலம் சிறுவர்களின் ஆளுமையிலேயே தங்கியிருப்பதனால், அர்த்தமுள்ள வாழ்வொன்றிற்கு அவர்களை உரித்துடையதாக்குவதனையுமே நோக்கமாகக் கொண்டதாகும். ஆகவே, இம் முயற்சியின் வெற்றி அனைத்து அரச அதிகாரிகளினதும் அக்கறையான செயற்பாட்டிலேயே தங்கியுள்ளது என்றால் மிகையாகாது.

# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

இலங்கை மனித உரிமைகள் ஆணைக் குழு 1996ஆம் ஆண்டின் 21ஆம் இலக்க இலங்கை மனித உரிமைகள் ஆணைக் குழுச் சட்டத்தினால் தாபிக்கப்பட்ட சுயாதீனமான ஆணைக்குழுவாகும். இந்த ஆணைக்குழு தோற்றுவிக்கப்பட்டதன் முக்கிய நோக்கம் யாதெனில், அரசியலமைப்புச் சட்டத்தினால் ஏற்றுக்கொள்ளப் பட்ட அடிப்படை உரிமைகள் மீறப்பட்டமை, விசாரனை செய்வதுடன் அதனால் பாதிக்கப் படுபவர்களுக்கு பொருத்தமான தீர்வுகள் மற்றும் பரிகாரம் வழங்கப்படுதலும் ஆகும். மேலும், மனித உரிமை மீறல்கள் தொடர் பாக விசாரனை செய்தல், பரிந்துரைகளைச் செய்தல் மற்றும் அதனால் பாதிக்கப்படு பவர்களுக்கு பொருத்தமான தீர்வினை அல்லது பரிகாரத்தை வழங்குதல், கைதி களைத் தடுத்துவைத்துள்ள இடங்களை மேற்பார்வை செய்தல், மனித உரிமைகளை மேம்படுத்தல், ஆராய்வு செய்தல் மற்றும் அரசிற்கு பரிந்துரைகளைச் செய்தல் என்பனவும் மனித உரிமைகள் ஆணைக் குழுவின் பணிகளில் மிக முக்கியமானவை களாகும்.

மேலும், பிரிவு 10(உ) வின்படி மனித உரிமைகள் துறையில் ஒப்பந்தங்களுக்கும் வேறு சர்வதேச தயார்படுத்தல் ஆவணங் களுக்கும் பங்களிப்புச் செய்தல், சர்வதேச சமவாயங்களை ஏற்றுக்கொள்வதன் அவசியம் என்பன தொடர்பிலும் அரசிற்கு பரிந்துரை செய்யும் பொறுப்பும் முக்கிய மானதாகும்.

இலங்கை மனித உரிமைகள் ஆணைக் குழுச் சட்டத்தின் பிரிவு 11(ஈ)வின்படி நீதிமன்ற கட்டளையின் பிரகாரம் அல்லது வேறு வகையில் அல்லது தடுத்துவைக்கப் பட்டுள்ளவர்களின் நலன் அவர்களை தடுத்து வைத்துள்ள இடத்தை தொடர்ச்சி யாக மேற்பார்வை செய்தல், அவர்களை தடுத்து வைத்துள்ள நிலைமை முன்னேற்ற அவசியமானவற்றை பரிந்துரைத்தல் போன்ற அதிகாரங்களின் அடிப்படையிலும், பிரிவு 11(உ)இன்படி மனித உரிமைகள் தொடர்பாக ஆய்வுகளைச் செய்தல், அந்த ஆய்வுகளின் விளைவை பகிரங்கப் படுத்தல், பகிர்ந்தளித்தல் போன்ற அதிகாரங்களின்படி, மனித உரிமைகள் ஆணைக்குழுவின் மேற்பார்வை மற்றும் மீளாய்வுப் பிரிவினால், சிறுவருக் குரிய அனைத்து தடுத்துவைத்தல் இல்லங் களையும் கண்காணிப்பு செய்தல் மற்றும் ஆய்வில் வெளிப்பட்ட காரணிகள் மீது மனித உரிமைகள் ஆணைக்குழுச் சட்டத்தின் பிரிவு 10(இ)இன் பிரகாரம் அடிப்படை உரிமைகளை அபிவிருத்தி செய்யும், விருத்தியாக்கும், பாதுகாக்கும் சட்டரீதியானதும் நிர்வாகரீதியானதுமான கட்டளைகளையும் செயற்திட்டங்களையும் தயாரிப்பதற்கு அரசிற்கு ஆலோசனை வழங்குதல், உதவிபுரிதல் என்ற நோக்கை முன்னெடுத்து பிரிவு 11(ஏ)இன்படி ஆணைக்குழுவின் நோக்கை செயற்படுத்து வதற்கு அவசியமான அல்லது உதவியான வேறு அனைத்தையும் செய்தல் என்ற அதிகாரத்தின்படி சிறுவர் தொடர்பில் செயற்படுகின்ற அரச அதிகாரிகள் பின்பற்ற வேண்டிய வழிகாட்டல் தயாரிக்கும் பொறுப்பை ஆணைக்குழு நிறைவேற்றி யுள்ளது. இது சிறுவரின் அதியுயர் நலன் மற்றும் நல்வாழ்வுக்காக செயற்பட அரச அதிகாரிகளுக்கு பெரும் உதவியாக இருக்கும் என்பதில் சந்தேகமில்லை.

# சிறுவர் உரிமைகள் தொடர்பான சர்வதேச தராதரங்கள்

சிறுவர் உரிமைகள் தொடர்பில் பரந்த நோக்கு சர்வதேச தராதரங்கள் மற்றும் சர்வதேச சட்டங்களினால் உறுதிப் படுத்தப்பட்டுள்ளது. அதன் மூலம் அரசும் சமூகமும் சிறுவரின் அதியுயர் நலனுக்காக எடுக்கவேண்டிய நடவடிக்கைகளை வலியுறுத்துகின்றன. மேலும், சிறுவர் உரிமைகளை பாதுகாத்தல் மற்றும் விருத்தி செய்தல் ஆகியவற்றுக்காக சர்வதேச தராதரங்களினூடாக முழு உலகிற்கும் வழிகாட்டப்படுகின்றது. அதன் மூலம் சிறுவர் உரிமைகளை பாதுகாப்பதற்கு அரசுக்குரிய பொறுப்பு, மதிப்பளித்தல், பாதுகாப்பதன் பெறுமதியை அரசுக்கு எத்திவைத்தல் என்பன நடைபெற்றுவருகின்றது.

| பிரகடனம் / சமவாயம் | பொருத்தமான விடயங்கள் |
|---|---|
| அனைத்துலக மனித உரிமைகள் பிரகடனம் | • அனைவருக்கும் வாழ்வதற்கும் சுதந்திரமாக சிந்திப்பதற்கும் சொந்தப் பாதுகாப்புக்கும் உரித்துடையவராவர்.<br>• குடும்பம் சமூகத்தின் பிரதான அங்கமாகும். அதற்கு சமூகத்தினதும் அரசினதும் பாதுகாப்பு கிடைக்க வேண்டும்.<br>• குழந்தைப்பருவம் விசேட உதவியும் பாதுகாப்பும் தேவையான பருவமாகும். திருமணம் முடித்த அல்லது திருமணமாகாத தாய்மாரின் மூலம் கிடைக்கும் அனைத்து குழந்தைகளும் சமமான பாதுகாப்பிற்கு உரித்துடையவராவர். |
